State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

# G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

# අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## (GEOGRAPHY)

## භූගෝල විද්‍යාව

# (QUESTION PAPER) - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**භූගෝල විද්‍යාව - I**

**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - **එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.**

- **1 සිට 05 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. අභ්‍යවකාශයේ සිට පෘථිවියට දෙසට පතිත වන උල්කාශ්ම බොයෝමයක් සැවී විනාශ වන්නේ .............. ගෝලයේදීය.
 (පරිවර්ති / අපරිවර්ති / මෙසෝ / තාප)

2. කොවිඩ් - 19 ( Covid - 19 ) වෛරසය මූලාරම්භ වූ වූහාන් නගරය පිහිටා ඇති භූ තැටිය ................... වේ.
 (යුරේසියානු භූ තැටිය / ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය / නැස්කා භූ තැටිය/ අප්‍රිකානු භූ තැටිය )

3. ශ්‍රී ලංකාවේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති වී පර්යේෂණායතනය ....................පිහිටා ඇත.
 (මහඉලුප්පල්ම / බතලගොඩ / හිඟුරක්ගොඩ / බෝඹුවල )

4. ශ්‍රී ලංකා 1: 50000 භූ ලක්ෂණ සිතියම් නිර්මාණය සඳහා ................ ප්‍රක්ශේපනය පදනම් කර ගෙන ඇත.
 (මෝල්වයිඩ් / කේතු / බොන් / මර්කේටර් )

5. 1(50000 භූ ලක්ෂණ සිතියමක වර්ග ප්‍රමාණය 4cm$^2$ කින් නිරූපිත සැබෑ භූමියේ විශාලත්වය .............. කි.
 ( වර්ග කිලෝමීටර 1 / වර්ග සෙන්ටිමීටර 1 / වර්ග කිලෝමීටර 4 / වර්ග සෙන්ටිමීටර 4)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

6. අර්ධ වශයෙන් දිරාපත් වූ ලවණ වර්ග සහ මැටි වර්ග B මහලෙහි තැන්පත් වී ඇත .
 ( නි/වැ)

7. ආසියානු ප්‍රදේශයේ බහුතරයකගේ ප්‍රධාන ආහාරය තිරිඟු යි.
 ( නි/වැ)

8. ශ්‍රී ලංකාවේ මාරවිල ප්‍රදේශය මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
 ( නි/වැ)

9. ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගන්නේ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙනි.
 ( නි/වැ)

10. පෘථිවි ප්‍රාවරණයට පෘථිවි ස්කන්ධයෙන් 1/3 ක් පමණ අයත් ය.
 ( නි/වැ)

- **අංක 11 සිට 18 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න**

11. උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහල බසී. එය ......................................................... නමින් හැඳින්වේ.


12. සුපර් සොනික් ජෙට් යානා ගමන කරන්නේ ............................................. ගෝලය තුළය.

13. ලෝකයේ විශාලතම විල ලෙස ............................................. විල හැඳින්විය හැක.

14. ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල්ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ ග්‍රීක ජාතික............................................. විසිනි.

15. තෙත් කලාපයට අවේනික, තේ,රබර්,කෝපි, කෝපි, කරඳමුංගු, කරාබුනැටි, හා පලතුරු වැනි වගාවන්ට සුදුසු පස ....................................................පස වේ.

- **අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කරගන්න**




ඉහත ප්‍රස්තාරයට අනුව

16. වැඩිම නිෂ්පාදන ප්‍රමාණයක් කර ඇත්තේ .......................................... වර්ෂවලදීය.

17. අඩුම වි අස්වැන්නක් ලබා ඇත්තේ .................................................................. වර්ෂවලදීය.

18. ආසන්න වශයෙන් 2010/11 වර්ෂවලදි වගා කර ඇති බිම් ප්‍රමාණය ..................................................... වේ.

**අංක 19 සිට 22 තෙක් දි ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුපිළිවෙළට අනුව 'ආ' තිරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත** ලියා දක්වන්න.

19.

| 'අ' | 'ආ' |
|---|---|
| 1 විල් ජලය | A. 8 % |
| 2 පාංශු ජලය | B. 52 % |
| 3 ජල වාෂ්ප | C. 1 % |
| | D. 38 % |

(1)ACB (2) BAD (3) BDA (4) ACB (.........)

20. ‘අ’ ‘ආ’

1 තස්මේනියා දූපත් A. උතුරු ඇමරිකානු තැටිය

2 බ්‍රිතාන්‍ය දූපත් B. අප්‍රිකානු තැටිය

3 කැනරි දූපත් C. ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය

D. යුරේසියානු තැටිය

(1) DCA (2) ADB (3) DBA (4) CDB (..........)

21. ‘‘අ’’ ‘‘ආ’’

1 සූර්ය බලය A. ලක්ෂපාන

2 .,ʼ අඟුරු B. බරුතකන්ද

3 ජල විදුලිය C. අඹේවෙල

D. නොරොච්චෝලෙ

(1) BDA (2) BAD (3) DAB (4) CDA (..........)

22. ‘‘අ’’ ‘‘ආ’’

1 පොල් වගාව A. මිලිමීටර 300 - 500 වර්ෂාපතනය


2 ඉරිඟු වගාව B. මිලිමීටර 2000 - 2500 වර්ෂාපතනය

3 තේ වගාව C. මිලිමීටර 2000 ට වැඩි වර්ෂාපතනය

D. මිලිමීටර 1900 - 5460 වාර්ෂික වර්ෂාපතනය

(1) ACB (2) DAB (3) BAD (4) BDA (..........)

- **අංක 23 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම යොදා ගන්න**




23. හෙල් මළු ක්‍රමයට වී වගාව සිදුකරන ප්‍රදේශය අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

24. ජල ගැලීම්වලට භාජනය වීමෙන් බොහෝවිට වගා හානි සිදුවන ප්‍රදේශයට අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

25. ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක් වී වගා කරනු ලබන ප්‍රදේශයට අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

- **ප්‍රශ්න අංක 26 සිට 36 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න**

26. බලශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා බලශක්ති උත්පාදක ජෛව ස්කන්ධයක් **නොවන්නේ** ?

(1) කෘෂි අපද්‍රව්‍ය (2) ජීව වායුව (3) සුළං (4) දැව (..........)

27. ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන සාධක දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) සූර්යයා හා ජලය (2) පස හා දේශගුණය (3) වියෝජකයින් හා ශාක (4) ජෛව සාධක හා අජෛව සාධක (..........)

28. ජීව විද්‍යාත්මක උපද්‍රවයක් වන්නේ,

(1) නියඟ (2) වසංගත රෝග (3) අකුණු සැර (4) ගිනිකඳු (..........)

29. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව පිහිටා ඇති පොල් පර්යේෂණායතනය පිහිටා ඇත්තේ,

(1) ලුණුවිල (2) මාතලේ (3) හිඟුරක්ගොඩ (4) ඇඹිලිපිටිය (..........)

30. ආග්නේය පාෂාණවලට නිදසුනකි .

(1) .ග්‍රැනයිට් (2) ජිප්සම් (3) දියමන්ති (4) මිනිරන් (..........)

31. ස්වාභාවික සම්පත් අතර පුනර්ජනනීය සම්පතක් වන්නේ,

(1) වාතය (2) සරු පස (3) වනජීවීන් (4) පාෂාණ (..........)

32. මිරිදිය මසුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,


(1) කාවයියා, සූඩයා, කනයා (2) ඇටවල්ලා, අලගුඩුවා, ලූලා

(3) මස්පෙතියා, කාවයියා, ගොඩයා (4) හුංගා, කනයා, සාලයා (..........)

33. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල භෞතික ලක්ෂණයක් **<u>නොවන්නේ</u>** කුමක්ද ?

(1) වාරි ඇළ (2) වනාන්තර (3) දිය ඇල්ල (4) ගං මෝය (..........)

- **පහත රූප සටහන උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 34 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,**




34. මෙම රූපසටහනේ A-B රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

(1) ජල කපොල්ලයි (2) සුළං කපොල්ලයි (3) දිය බෙත්මයි (4) දුර්ගයයි (..........)

35. මෙම රූපසටහනේ C - D රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) උත්තල බෑවුමකි (2) දළ බෑවුමකි (3) අවතල බෑවුමකි (4) මොහොර බෑවුමකි (..........)

36. මෙම රූපසටහනේ E - F රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) නෙරුවකි (2) නිම්නයකි (3) කොත් කන්දකි (4) උත්තල බෑවුමකි (..........)

- **පහත A,B,C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

A - ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
අන්තගාමී දේශගුණ ලක්ෂණ ඇතිවීම

B - උන්නතාංශය
වායු පීඩනය

C - ශ්‍රී ලංකාව දූපතක් වීම
මිරිදිය ධීවර කර්මාන්තය

D - පොසිල ඉන්ධන භාවිතය
පරිසර දූෂණය

37. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

38. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ ද වැඩි වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

39. දෙවැන්නේ අඩු වීම පළමුවැන්නේ අඩු වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

40. පළමුවැන්න හා දෙවැන්න අතර සෘජු සම්බන්ධතාවක් නොදක්වන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)